# විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS)

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ තනතුර

### පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIS) අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ

PGIS යනු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් සහ පර්යේෂණ සම්පාදනය, ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා 1996 දී පිහිටුවන ලද ජාතික ආයතනයකි. PGIS හි වැඩසටහන් අධ්‍යයන මණ්ඩල එකොළහක් මගින් මෙහෙයවේ එනම් ජෛව රසායන විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව, ජෛව වෛද්‍ය විද්‍යාව, රසායනික විද්‍යාව, භූමි (Earth) විද්‍යාව, පාරිසරික විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, ශාක විද්‍යාව, විද්‍යා අධ්‍යාපනය, සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව වේ.

PGIS හි ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්ෂ වරයා පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම්කරණ නිලධාරියාද වේ. අධ්‍යක්ෂවරයා නිල වශයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකත්වය හා සභාපති ධුරය දරන අතර, ආයතනයේ සෑම අධ්‍යයන මණ්ඩලයකම නිල වශයෙන් සාමාජිකයකු වේ. ධුර කාලය වසර තුනක් වන අතර, අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

අපේක්ෂිත අයදුම්කරු ඉහත සඳහන් කළ ඕනෑම විද්‍යා විෂයක පශ්චාත් උපාධි සුදුසුකම් තිබිය යුතු අතර, පර්යේෂණ සහ පරිපාලන පළපුරුද්ද පිළිබඳ විශිෂ්ඨ වාර්තාවක් තිබිය යුතුය. අධ්‍යාපන ආයතනයක පරිපාලන පළපුරුද්ද අමතර සුදුසුකමකි. බහුවිධ අධ්‍යන පරිසරයක් තුළ රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය විශිෂ්ඨ අන්තර් පුද්ගල කුසලතා සහ ප්‍රජාව කෙරෙහි ආයතනයේ කැපවීම පිළිබඳ අවබෝධය සාර්ථක අයදුම්කරු සතුවිය යුතුය. ඔහු/ ඇය, අධ්‍යයන නායකත්වය සැපයීම සහ කළමනාකරණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම දැරිය යුතුය.

**පහත දැක්වෙන ලියකියවිලි අයදුම්පත සමග අමුණා එවිය යුතුය.**

i. උපන් දිනය, ප්‍රකාශන ලැයිස්තුව, දරන ලද පරිපාලන තනතුර සහ අධ්‍යාපනික/ වෘත්තීය ජයග්‍රහණ ඇතුලුව අයදුම්කරුගේ විස්තීර්ණ අයදුම්පතක් (CV)

ii. ආයතනයේ සංවර්ධනය සඳහා වූ දැක්ම පිළිබඳ ප්‍රකාශයක්.

iii. පත්වුවහොත් ළඟාකර ගැනීමට යෝජිත ජයග්‍රහණ පිළිබඳ කෙටි විස්තරයක්

iv. වර්තමාන අධ්‍යක්ෂකවරයා අයදුම්කරුවෙක් නම් හෝ මීට පෙර ආයතනයේ අධ්‍යක්ෂධූරය දැරුවෙක් නම් ඔහු/ ඇය පළමු නිල කාලය තුළ ලබාගත් ජයග්‍රහණ උපුටා දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

v. අයදුම්කරු දැනට රාජ්‍ය සේවයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක, සේවයේ යෙදෙන්නෙක් නම් පත්වීම ලද හොත් එයින් නිදහස් කළ හැකි බවට සේවායෝජකයා විසින් නිකුත් කරන ලද ලිපියක්.

අයදුම්පත් 2024 සැප්තැම්බර් 24 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර්, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තැ. පෙ. 25, පේරදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම සිදුකළ හැක. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"අධ්‍යක්ෂ තනතුර, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, තැ. පෙ. 25, පේරාදෙණිය විශ්වවිද්‍යාලය"** යනුවෙන් දැක්විය යුතුය.

ඊට අමතරව කරුණාකර ඉහත දැක්වූ ලිපි ලේඛන සහ වෙනත් ආධාරක ලිපි ලේඛනයන් හි මෘදු පිටපත්, PDF ආකෘතියෙන් sar@pgis.lk විද්‍යුත් තැපැල වෙත එවිය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා දුරකථන අංක 081-2394782 ඔස්සේ සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී PGIS හි ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර් ඇමතීම හෝ www.pgis.lk වන PGIS වෙබ් අඩවියට පිවිසීම කළ හැක. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 ජනවාරි 01 දිනැති අංක 2024/01 දරන චක්‍රලේඛයේ දක්වා ඇති ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම සිදු කෙරේ. අධ්‍යක්ෂ තනතුර පත්කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඉහත දැක්වූ චක්‍රලේඛය පරිශීලනය කරන්න.

**ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර්,**<br>
**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**<br>
**2024 අගෝස්තු 25**